# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/22 – 2017 ඔක්තෝබර් 04 වැනි බදාදා – 2017.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්පෙ පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, වල්පොල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ජීඒ/වයිකේකේ/2016/710 සහ 2016.08.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පතිරණගේ වත්ත, කෝන්ගස්ගොඩ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0025**

උතුරට: කටකන්ද දෙල සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: එච්. කේ. ලීලාවතී හිමිකම් කියන පතිරණගේ වත්ත, කෝන්ගස්ගොඩ වත්ත; බටහිරට: එච්. කේ. ලීලාවතී හිමිකම් කියන පතිරණගේ වත්ත, කෝන්ගස්ගොඩ වත්ත සහ කටකන්ද දෙල.

02. **කැබලි අක්ෂර 'බී' – කලුකඳ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0013**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ ඩබ්ලිව්. කේ. කරුණාපාල හිමිකම් කියන කලුකඳ වත්ත; නැගෙනහිරට: ඩබ්ලිව්. කේ. කරුණාපාල හිමිකම් කියන කලුකඳ වත්ත සහ කටකන්ද දෙල; දකුණට: කටකන්ද දෙල; බටහිරට: මාර්ගය (මා.සං.අ.).

03. **කැබලි අක්ෂර 'සී' – පතිරණගේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0090**

උතුරට: කටකන්ද දෙල සහ එම්. කේ. පී. කල්‍යානවංශ හිමිකම් කියන පතිරණගේ වත්ත; නැගෙනහිරට: එම්. කේ. පී. කල්‍යානවංශ හිමිකම් කියන පතිරණගේ වත්ත සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කටකන්ද දෙල.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2016/එච්ඩබ්ලිව්/321.
2017 අගෝස්තු මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 580



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.